# ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

ළමා ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ
පසු පිටු සකස් විය යුතු ආකාරය
පිළිබඳ නියමු අත්පොත

# ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

ළමා ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ
පසු පිටු සකස් විය යුතු ආකාරය
පිළිබඳ නියමු අත්පොත

සම්පාදනය
**සේනානි ගුණතිලක බණ්ඩාර**
**සජන්ති බෝපිටිය**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

පළමු මුද්‍රණය 2018

ISBN: 978-955-7544-28-1

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද
ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය : සම්පාදනය සේනානි ගුණතිලක බණ්ඩාර සහ සජන්ති බෝපිටිය. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2018
පි. 40 : චිත්‍ර ; සෙමී. 21

ISBN 978-955-7544-28-1 මිල : රු. 250.00
i. 070.5 ඩීවී 23 ii. බණ්ඩාර, සේනානි ගුණතිලක (සම්.)
iii. බෝපිටිය, සජන්ති (සම්.)

1. ප්‍රකාශකයෝ සහ ප්‍රකාශන
2. පොත් කර්මාන්තය හා වෙළඳාම

ප්‍රකාශනය : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථනය: 011 2687583, 011 2698847
ෆැක්ස්: 011 2687583, 011 2685201
ඊමේල්: nldsb@mail.natlib.lk

මුද්‍රණය : ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත,
කොළඹ 10.

## උපදේශක දායකත්වය

ආචාර්ය ඩබ්ලියු ඒ. අබේසිංහ මහතා
විජිත වෙලගෙදර මහතා
සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය
රන්ජිත් ධර්මකීර්ති මහතා
දෙනගම සිරිවර්ධන මහතා
සිබිල් වෙත්තසිංහ මහත්මිය
පියල් උදය සමරවීර මහතා
ජේ. මදිවානම් මහතා
ආර්. එච්. එන්. නන්දසිරි මහතා
උදිත අලහකෝන් මහතා
පී. ජී. ප්‍රේමදාස මහතා
එච්.ඩී. ප්‍රේමසිරි මහතා
දිනේෂ් කුලතුංග මහතා
මහාචාර්ය දයාරෝහණ අතුකෝරල මහතා
ඩබ්ලිව්. සුනිල් මහතා
ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මිය

## පෙරවදන

ළමා සාහිත්‍යය යනු සමාස පදයකි. එමගින් කරුණු දෙකක් ගම්‍ය වේ. පළමුවැන්න වැඩිහිටියන් විසින් දරුවන් සඳහා රචනා කරනු ලබන සාහිත්‍යය හා දෙවැන්න ළමයින් විසින් ළමයින් සඳහාම රචනා කරනු ලබන සාහිත්‍යයි. සෑම රටකම අනාගතය රඳා පවතින්නේ එම සමාජයේ වැඩිහිටියන් විසින් ළමා පරපුරට ලබා දෙනු ලබන සමාජ දායාද මතය. දරුවෙකු මෙලොවට බිහිවීමේ සිට ක්‍රමයෙන් පරිණත වී ස්වාධීනව කටයුතු කිරීමට ශක්තිය ලබන තෙක් ළමයාගේ පූර්ණ වර්ධනයට අවශ්‍ය කටයුතු සැපයීම හා පරිසරය සකසාලීම වැඩිහිටි දෙමාපියන්ගේ භූමිකාව වන්නේය. ඒ අනුව මෙම මානව සංවර්ධනය අර්ථවත්ව හා ගුණාත්මකව ක්‍රියාත්මක කිරීමෙහිලා සාහිත්‍යයට ඉටුකළ හැකි අගය අපමණය.

ළමා සාහිත්‍ය කෘතියක් මගින් දරුවන්ගේ වාග් මාලාවට අලුත් වචන එකතු කිරීම නිදහස් චින්තනය පරිකල්පනය වර්ධනය කිරීම ඇතුළුව දරුවන් සමාජානුයෝජනය කිරීමේ හැකියාවද පවතී. ළමයාගේ සංවර්ධනය කෙරෙහි සාහිත්‍යය සහ අමතර කියවීම ඉතාම වැදගත් වන අතර මෙම සංකල්ප මත පදනම්ව ළමා සාහිත්‍යය විෂය තුළ ළමා හා යොවුන් සාහිත්‍ය කෘති බිහි විය යුතුය. එහෙත් වර්තමානයේදී සාහිත්‍ය කෘති පළ කිරීම කුමන අරමුණක් කරා මෙහෙයවිය යුතු ද යන්න පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් බහුතරය තුළ පැහැදිලි අවබෝධයක් නොමැත. මේ නිසා ප්‍රමිතියකින් හා ගුණාත්මක බවින් තොරව බිහිවන ළමා කෘති දරුවන්ගේ ලෝකයට සිදු කරනු ලබන හානි අපමණය. ඒ අනුව දරුවන්ගේ කියවීම උදෙසා ඵලදායී ළමා සාහිත්‍යයක් ගොඩනැංවීම හා දරුවන් කියවීම වෙත නැඹුරු කරවීම යුගයේ අවශ්‍යතාවකි. මීට සාපේක්ෂව ළමා ග්‍රන්ථ ප්‍රකාශනයන්හි දැනට පවතින ගුණාත්මක බව ඉහළ නැංවීම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. ළමා ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිති භාවිත නොකිරීම බොහෝ ප්‍රකාශනවල දක්නට ලැබේ. ග්‍රන්ථයක මුල් පිටු අන්තර්ගතය සහ පසුපිටු සකස් විය යුතු සම්මත ආකරය ඇතුළු සමස්ත සැකැස්ම පිළිබඳව සමහර ප්‍රකාශකයන් හා ලේඛකයින් සතු අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොපැවතීම මෙම තත්ත්වයට බලපා ඇත. විශේෂයෙන් කර්තෘ ප්‍රකාශනවල මෙම දුර්වලතා බහුලව දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගුණාත්මක උන්නතිය උදෙසා පසුගිය කාලය පුරා සක්‍රීය දායකත්වයක් සැපයූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් මෙම කරුණ කෙරෙහි සිය අවධානය යොමු කර ළමා ග්‍රන්ථකරණයට මග පෙන්වීමක් ලෙස මෙම කෘතිය එළිදැක්වීමට කටයුතු කරන ලදි.

ලේඛකයින්, ප්‍රකාශකයින්, මුද්‍රණකරුවන් සහ ප්‍රකාශන ක්ෂේත්‍රයට සම්බන්ධ ආධුනිකයන් හට ඉතා ප්‍රයෝජනවත් වන මෙම ග්‍රන්ථය එළිදැක්වීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දුන් මණ්ඩලයීය අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් මහතා, උපදේශක මණ්ඩලයේ විද්වතුන්, ග්‍රන්ථ සම්පාදන කටයුතු සිදුකළ අධ්‍යක්ෂිකා සේනානි බණ්ඩාර මහත්මිය හා ප්‍රකාශන නිලධාරිනී සජන්ති බෝපිටිය මහත්මිය, අක්ෂර සංයෝජනය කටයුතු සිදු කළ මානෙල් චාන්දනී මහත්මිය, තනූජා රංගිකා මහත්මිය සහ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ හිටපු අංශ ප්‍රධාන සහකාර අධ්‍යක්ෂිකා ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මිය, අනුරුද්ධිකා දිසානායක මහත්මිය ඇතුළු ප්‍රකාශන අංශයේ කාර්යමණ්ඩලයට ස්තුතිය පුද කර සිටිමි. එසේම මෙම ග්‍රන්ථයෙහි මුද්‍රණ කටයුතු සිදු කළ ෆාස්ට් ප්‍රින්ටරි ආයතනයේ ප්‍රේම් දිසානායක මහතා ඇතුළු කාර්යමණ්ඩලයට හා සහාය දුන් සැමට මාගේ හෘදයංගම ස්තුතිය පුද කර සිටිමි.

**නීතිඥ පී.එම් දීපාල් චන්ද්‍රරත්න**
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07
2018 දෙසැම්බර්

# හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භ යුගයටත් පෙර සිටම දරුවන් සඳහා කතාන්දර කියා දීම, අසා සිටීමට සැලැස්වීම, නාට්‍යමය ආකාරයෙන් රඟ දක්වා පෙන්වීම පැවැතිණි. කාර්මික විප්ලවයෙන් අනතුරුව සිදුවූ මුද්‍රණ කර්මාන්තය ඇතුළු විවිධ අංශයන් හි දියුණුවත් සමඟ එතෙක් පවුල් පරිසරය තුළින් ලැබූ මෙම වින්දනය සමාජයක්, රටක් හා ඉන් අනතුරුව ලෝක මට්ටමෙන් ළමයා වෙත ළඟාවන්නට විය. ඒ අනුව දැනට සියවස් කිහිපයක සිට ළමයින් සඳහා විවිධ සාහිත්‍ය නිර්මාණ මහා පරිමාණ වශයෙන් වාණිජ මට්ටමෙන් ලෝකය තුළ එළි දකී. ඒ අතර ළමා කතාන්දර පොත්වලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. රසවින්දනය, භාෂාවේ දක්ෂතාවක් ඇති කිරීම සඳහා වන අතිරේක කියවීම් පොත් වශයෙන් භාවිත කිරීමට ළමා සාහිත්‍ය කෘති බිහිවිය. එසේම ළමා සාහිත්‍යයක වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳ දීර්ඝ කාලීන ලෙස සාකච්ඡාද සිදුවිය. ළමා මනසේ සංවර්ධනයට මෙන්ම ළමයෙකුගේ පෞරුෂය ගොඩනැගීමට ගුණාත්මක මට්ටමේ ළමා කෘති බහුල විය යුතු බව ලෝකයේ බොහෝ රටවල විද්වතුන් අවිවාදයෙන් පිළිගෙන ඇත. ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය තුළ අද වන විට සංඛ්‍යාත්මකව ළමා ග්‍රන්ථ බහුලව මුද්‍රණය වුවත්, ඒවායේ ගුණාත්මක මට්ටම සම්බන්ධයෙන් පවතිනුයේ කිසිසේත් සෑහීමකට පත්විය නොහැකි තත්ත්වයකි. ඒ අතර, නවීන තාක්ෂණය, සමග බිහි වූ නියාමනයක් නොමැති විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් දරුවන් සමාජයේ විවිධ වූ ව්‍යසනයන්ට ගොදුරු වන ආකාරය එම මාධ්‍ය තුළම දිනපතා පළ වේ.

මෙම ව්‍යසනයෙන් දරුවන් මුදා ගැනීමෙහිලා මුල් අඩිතාලම වශයෙන් ඔවුන්ගේ රුචිය උසස් මට්ටමකට නංවන ගුණාත්මක ළමා සාහිත්‍යයක් බිහි කිරීම සම්බන්ධයෙන් ලේඛකයා වෙත පැවරෙන්නේ දැවැන්ත සමාජමය වගකීමකි.

නිසි ප්‍රමිතියෙන් යුත් සාර්ථක ළමා සාහිත්‍යයක් නිර්මාණය කිරීම සඳහා ලේඛකයන් දැනුවත් විය යුතු කරුණු රාශියක් තිබේ. එම අංශ මැනවින් අධ්‍යයනය කිරීම තුළින් ලේඛකයන්ට සිය ලේඛන කාර්යය සඳහා අත්දැකීම් රාශියක් ලබා ගත හැකිය. නිර්මාණකරුවෙකුට සිය නිර්මාණය කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳ සීමාවන් හෝ නීති පැනවීමට නොහැකි වුවත්, ළමා සාහිත්‍ය කෘති බිහි කරන්නේ දරුවන් වෙනුවෙන් නිසා ඒ පිළිබඳ නියමුවක් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## පටුන


(1) හැඳින්වීම ix

(2) ළමා සාහිත්‍ය කෘතියක අන්තර්ගතයේ මූලිකාංග 1

2.1 සාහිත්‍යමය සන්දර්භය ගොඩනැංවීම

2.1.1 කතාවේ තේමාව 2
2.1.2 ග්‍රන්ථ නාමය 3
2.1.3 පසුතලය 3
2.1.4 චරිත 4
2.1.5 කතා වස්තුව සැකිල්ල 5
2.1.6 ගැටුම 6
2.1.7 කතාවේ අවසානය 6

2.2 භාෂා භාවිතය 8

2.2.1 වාග්මාලාව 8
2.2.2 වාක්‍ය රටා 9
2.2.3 භාෂා උපක්‍රම 9
2.2.4 අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ 9

2.3 පින්තූර, චිත්‍ර හා වර්ණ භාවිතය 10

(3) ළමා ග්‍රන්ථයක භෞතික නිමාව 16

3.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව 16
3.2 අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව 17
3.3 ග්‍රන්ථනාම පිටුව 18
3.3.1 ග්‍රන්ථනාමය 18
3.3.2 කර්තෘ 18
3.3.3 ප්‍රකාශක 19
3.3.4 පුස්තකාල බලපත්‍රය 19

| | | | |
|---|---|---|---|
| 3.4 | ග්‍රන්ථ නාම පිටුවෙහි පසු පිටුව | | 20 |
| | 3.4.1 | අනුග්‍රහය පිළිබඳ ප්‍රකාශය | 20 |
| | 3.4.2 | කර්තෘ හිමිකම් ප්‍රකාශය | 20 |
| | 3.4.3 | පුනර් මුද්‍රණය | 21 |
| | 3.4.4 | අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) | 21 |
| | 3.4.5 | පාසල් පුස්තකාල බලපත්‍රය | 22 |
| | 3.4.6 | ග්‍රන්ථය සඳහා දායක වූවෝ | 22 |
| | 3.4.7 | ප්‍රකාශක | 23 |
| | 3.4.8 | බෙදාහැරීම | 23 |

(4) පිටකවර සකස් කිරීම 23

(5) පිටු අංකනය කිරීම 25

(6) අකුරු ප්‍රමාණය හැඩය හා යෙදවීම 25

(7) ග්‍රන්ථයේ සමස්ත නිමාව 26

## ළමා සාහිත්‍ය කෘතියක අන්තර්ගතයේ මූලිකාංග

### 2.1 සාහිත්‍යමය සන්දර්භය ගොඩනැංවීම

දරුවකුගේ බුද්ධි වර්ධනය හා සමාජානුයෝජනය, දරුවා අසන, දකින, අත්දකින සියලු බාහිර ක්‍රියාකාරකම් තුළින් මෙන්ම, කියවන පොත පත එහි ඇතුළත් සිතුවම් ඇතුළු සියලු මාර්ග මගින් නිරායාසයෙන් සිදුවේ. එබැවින් ළමා සාහිත්‍ය නිර්මාණකරණය සෙසු සාහිත්‍ය නිර්මාණවලට වඩා වැඩි සමාජ වගකීමක් සහිත කාර්යයක් වේ. මෙහිදී දරුවන් වෙනුවෙන් ග්‍රන්ථ නිර්මාණය කිරීමේ දී කරුණු ගණනාවක් පිළිබඳව සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රකට මනෝ විද්‍යාඥ පියාජේට අනුව ළමා අවධිය කොටස් කිහිපයකට බෙදා වෙන් කර දක්වා ඇත.

1 ඉන්ද්‍රීය චාලක අවධිය (උපතේ සිට අවුරුදු 2)

2 පූර්ව ක්‍රියාකාරී අවධිය

- (a) පූර්ව සංකල්පන අවධිය (අවුරුදු 2 සිට 4)
- (b) ප්‍රතිභා චින්තන අවධිය (අවුරුදු 4 සිට 7)

3 ක්‍රියාකාරී චින්තන අවධිය

- (a) සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය (අවුරුදු 7 සිට 11)
- (b) විධිමත් ක්‍රියාකාරි අවධිය (අවුරුදු 12 සිට 18)

ළමා ග්‍රන්ථ නිර්මාණකරණයේ දී ලේඛකයා විසින් තමන් නිර්මාණය ඉදිරිපත් කරනු ලබන්නේ කුමන වයස් කාණ්ඩයකට අයත් දරුවන් සඳහා ද යන්න පළමුවෙන්ම හඳුනාගත යුතුය.

එසේම ළමා සාහිත්‍යකරණයේ දී ප්‍රමුඛ වන පහත අරමුණු සම්බන්ධයෙන් ලේඛකයාගේ අවධානය යොමු කිරීම වැදගත් වේ.

1 වින්දනය හා විනෝදාස්වාදය ලබා දීම.

2 සංස්කෘතියේ යහපත් අංග පවරා දීම.

3 තමන් හා අවට පරිසරය අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලැසීම.
4 පරිකල්පන හැකියාව වර්ධනය.
5 තොරතුරු සහ දැනුම වර්ධනය.
6 භාෂා කුසලතා වර්ධනය. (වාචික / ලිඛිත)
7 සංවේදීතාව ඇතුළු මානව ගුණධර්ම වර්ධනය.

### 2.1.1. කතාවේ තේමාව

කතා තේමාව තෝරා ගැනීමේදී විවිධ සාහිත්‍ය ශානර අතරින් තමන් තෝරා ගන්නා ශානර කාණ්ඩය හඳුනා ගැනීම වැදගත්ය.

**ළමා සාහිත්‍ය ශානර (GENRES)**

සුරංගනා කතා/ මායා කතා/ මිත්‍යා කතා/ වීර කතා/ අබිරහස් කතා/ ආගමික කතා/ චරිත කතා/ ඓතිහාසික කතා/ අතිශයෝක්ති කතා/ විද්‍යා ප්‍රබන්ධ/ පරිසරය හා චාරිකා ඇසුරු කර ගන්නා කතා

- ඉහත ශානර කාණ්ඩ අතරින්, එක් ශානරයක් යටතේ තේමාව තෝරා ගැනීම කළ හැකිය.
- එසේම එක් කතා තේමාවක් තුළ ඉහත ශානර වර්ග කිහිපයක් ඔස්සේ විහිදී යන කතාද නිර්මාණය කළ හැකිය. උදාහරණ : පරිසරය තේමා කර ගත් කතාවක් වීර කතාවක මායා කතාවක ස්වරූපයෙන්ද නිර්මාණය කළ හැකිය.
- විවිධ වයස් කාණ්ඩවලදී දරුවන් තුළ විවිධ සාහිත්‍ය ශානර කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති වේ. උදාහරණ ක්‍රියාකාරී චින්තන අවධියේ වයස 10-12 අතර වයස්වල දරුවන් වීර කතා, අබිරහස් කතා කියවීමට වැඩි රුචියක් දක්වයි. පූර්ව ක්‍රියාකාරි අවධියේදී දරුවන් සුරංගනා කතා කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි.
- කතා තේමාව, අදාළ වයස් කාණ්ඩයට උචිත හා ගැළපෙන අයුරින් සකස් කර ගත යුතුය.

### 2.1.2. ග්‍රන්ථ නාමය

- කතාවේ තේමාවට ගැළපෙන ග්‍රන්ථ නාමයක් යෙදිය යුතුය.
- ග්‍රන්ථ නාමය කතාව කියවීමට පෙළඹීමක් හා කුතුහලයක් ඇති කරවීමට සමත් විය යුතුය.
- කතාවේ සමස්තය නියෝජනය වීමක් ග්‍රන්ථ නාමයෙන් සිදුවිය යුතුය.
- සරලව වටහා ගත හැකි ග්‍රන්ථ නාමයක් යෙදිය යුතුය.

  මෙහිදී ප්‍රදේශීය ව්‍යවහාර ඇසුරින් හෝ පොදුවේ භාවිත නොවන වචන ඇතුළත්ව ග්‍රන්ථ නාමය සකස් නොකළ යුතුය.

  උදාහරණ : ''වාජ්ජමේ කතාන්දරය''

  මෙහි වාජ්ජම යන්න රබාන හෝ බෙර සඳහා යොදන තවත් නමක් වුවත්, එය පොදු ව්‍යවහාරයේ නොමැති වචනයක් නිසා ඕනෑම අයෙකුට එකවර වටහා ගැනීම අපහසු වේ. එබැවින් එය ''එකැස් බෙරේ කතාන්දරය'' යනුවෙන් යෙදීම සුදුසුය.

- ළමා මනසට ඍජුව හෝ වක්‍රව හානිකර පණිවුඩයක් ග්‍රන්ථ නාමය මගින් සම්ප්‍රේෂණය නොවිය යුතුය.

  උදාහරණ : තල සොරකම් කළ රජකුමරුවෙකුට දඬුවම් කළ දිසාපාමොක් ගුරුතුමා පිළිබඳ සඳහන් ජාතක කතාවක් ඇසුරෙන් ගොඩනැගෙන ළමා කතාවක් ''හොරෙක් රජකරවූ ගුරුතුමා'' යනුවෙන් ග්‍රන්ථ නාමය යොදන්නේ නම් එය ළමා මනසට හානිකර වන්නකි.

### 2.1.3 පසුතලය

කතාවට පසුබිම වන කාලය හා ස්ථානය හෝ චරිත පිළිබඳ වටපිටාව පසුතලය මගින් විස්තර කර දැක්වේ. මෙහිදී කතාවේ ගලායාමට ගැළපෙන හා උචිත පරිදි, සෞන්දර්යාත්මකව, විචිත්‍රව, වර්ණිත පරිසර තත්ත්වයන්, සතුට හෝ ත්‍රාසය, භීතිය, ශෝකය වැනි විවිධ මනෝභාවයන් ජනනය වන ආකාරයට රචනාව සිදු කළ හැකිය.



- පසුතලය මගින් කතාවේ ගලායාමට මනා පිටිවහලක් ලැබිය යුතුය.

උදාහරණ - එදා තමා හරි හුළඟ! හුළඟ පමණක් නම් මැදෑ? අතරින් පතර මොර සූරන වැස්ස! මුළු වනය මහ කුණාටුවෙකින් කැලඹී ගිය මුහුදක් මෙන් විය.... (හීන්සැරය, කුමාරතුංග මුනිදාස)

- ළමා රචනාවක තාත්වික ලෝකයේ සිදුනොවන, හමු නොවන පසුබිමක් නිර්මාණය කළ හැකිය. එහෙත් ඒ එකිනෙක අවස්ථාවන්හිදී පරස්පරතා ඇති නොවන ආකාරයට විශ්වසනීයත්වයක් ගොඩ නැඟෙන පරිදි නිර්මාණය කළ යුතුයි.

### 2.1.4 චරිත

ළමා කතාවක විවිධ චරිත නිර්මාණය කළ හැකිය. මිනිස්සු, සත්තු, ගහකොළ, සජීවීකරණය කරන ලද විවිධ භාණ්ඩ හෝ නිර්මිත සත්වයන් වශයෙන් මේවා විවිධාකාර වේ.


- එක් චරිතයක් ප්‍රධාන චරිතය විය හැකිය.
- සෙසු චරිත ගොඩනැඟීමේදී එම සියලු චරිත අතර මනා සම්බන්ධතාවක් ගොඩනඟා තිබීම වැදගත් වේ.

- ඇතැම් සුළු චරිත අනවශ්‍ය ලෙස ඉස්මතු වීම සිදු නොවිය යුතු අතර, චරිත හැසිරවීම, සමබරව පවත්වා ගෙන යා යුතුය.
- චරිත හැසිරවීමේදී විශ්වසනීයත්වය ගොඩනැගෙන ආකාරයට නිර්මාණය විය යුතුයි.


  උදාහරණ - තාත්වික පරිසරයන් සහිතව ගොඩනැගෙන රිළවු රංචුවක කතාන්දරයක හාමස් කෑමට ලොල් වූ රිළවෙකු අත තිබූ පලතුරු විසි කර හාවා පසුපස හඹා යාම.

  මෙය තාත්වික ලෝකයෙන් පරිබාහිරව නිර්මිත පරිසරයක් හෝ නිර්මිත රිළව් කොටසක් සම්බන්ධයෙන් නම් ගැටලුවක් නැත.

### 2.1.5 කතා වස්තුවේ සැකිල්ල

කිසියම් සිද්ධි මාලාවක් අනුපිළිවෙළකට සංවිධානය කිරීමෙන් කතාන්දරයක් ගොඩනැගේ. මෙහිදී කතාවේ ආරම්භය, කතාව ගලා ගෙන යාම, ගැටුම්, උච්ච අවස්ථාව, හැරවුම් ලක්ෂ්‍යය හෝ හැරවුම් ලක්ෂ දෙකතුනක්, කතාවේ බැසීම, අවසානය, පණිවුඩය යන අවස්ථා ඇතුළත්ව කතාව නිර්මාණය කළ යුතුයි. ඇතැම් කතාවක අවසානයට පණිවුඩයක් ඇතුළත් නොවූවත් සමස්තය තුළින් එය දරුවාට උකහාගත හැකි ආකාරයට නිර්මාණය කළ යුතුයි.

- කතාව ගලායාමේදී කුතුහලය රඳවා ගැනීමට සමත් විය යුතුයි.
- අනවශ්‍ය ලෙස පුනරුක්ති යෙදී නොතිබිය යුතුයි.




### 2.1.6 ගැටුම / ගැටුම්

- ගැටුම /ගැටුම් නිරූපණය පැහැදිලි විය යුතු අතර සංකීර්ණ නොවිය යුතුය.
- ගැටුම /ගැටුම් අදාළ වයස් කාණ්ඩයට ගැළපෙන පරිදි නිර්මාණය විය යුතුය.
- ගැටුම /ගැටුම් නොගැළපෙන ලෙස ඇතුළත් නොකර කතාවට ගැළපෙන අයුරින් අදාළ කරගෙන තිබිය යුතුය.

### 2.1.7 කතාවේ අවසානය

- කතාවේ අවසානය කිසිසේත්ම ළමා මනසට හානිකර නොවිය යුතු අතර, ධනාත්මක ප්‍රවේශයකින් හෝ වින්දනාත්මකව අවසන් විය යුතුය.

- කතාව කියවීමෙන් ළමා මනසට රසඥතාවක් මෙන්ම කතාව මගින් මානව සංස්කෘතියේ යහපත් අංග පවරා දීමක් සිදු විය යුතුය
- විවිධ සිද්ධි හා ගැටුම් ආශ්‍රයෙන් දුක, සතුට, ත්‍රාසය, භීතිය, දයාව, අනුකම්පාව, කෝපය වැනි විවිධ මනෝභාවයන් ජනිත වන ආකාරයට කතාවේ ගලා යාම සිදු වුවත්, කිසිදු අවස්ථාවක වෛරී සිතුවිලි හෝ කතාව කියවා අවසානයේ මනස බිඳ නොවැටෙන ආකාරයට කතාව නිර්මාණය විය යුතුය.
- ජීවිතයේ විවිධ අභියෝග ඇතිවන බව, ඒවාට මුහුණ දීමට සිදුවන බව හා ඒ සඳහා දිරිමත්වීම අවශ්‍ය බව සාහිත්‍යානුසාරයෙන් සරලව දරුවාට ඒත්තු ගැන්විය යුතුය.
- පහත උදාහරණ විමසීමෙන් ඇතැම් ළමා ග්‍රන්ථ, ළමා මනසට කොතරම් හානිකර වන්නේද යන්න වටහා ගතහැකිය.

උදාහරණ 1



උදාහරණ 2




## 2.2 භාෂා භාවිතය

**2.2.1 වාග් මාලාව :**

- අදාළ වයස් කාණ්ඩවලට උචිත වාග්මාලාවක් භාවිත කළ යුතුයි.
- භාෂාව නිරවුල්ව භාවිත කළ යුතුයි. කෙටි වැකි සහිත සරල සුගම බස් වහරක් යෙදිය යුතුයි.
- භාවිත කර ඇති වාග්මාලාව ළමයාගේ වාග්කෝෂය සංවර්ධනයට හා පරිකල්පනයට දායකත්වයක් ලැබිය යුතුය.

**2.2.2 වාක්‍ය රටා :**

- අදාළ වයස් කාණ්ඩයට ගැළපෙන පරිදි වාක්‍ය රටාව ගළපා තිබිය යුතුය.
- එකම පොතෙහි විවිධ ස්ථානවල විවිධ ශෛලිවලට අයත් නොගැළපෙන වාක්‍ය රටා ඇතුළත්ව නොතිබිය යුතුය.

**2.2.3 භාෂා උපක්‍රම :**

- සරල උපමා රූපක, යෙදුම් සහිත ළමා මනසට ගැළපෙන ආකාරයේ භාෂා උපක්‍රම යෙදිය යුතුයි.

**2.2.4 අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ**

- වයස් කාණ්ඩය අනුව කථන බසද ලිවීම සඳහා භාවිත කළ හැකිය. එහෙත් අක්ෂර වින්‍යාසය නිවැරැදි විය යුතුය.
- ලිඛිත බසින් රචනය සිදු කරන්නේ නම් ව්‍යාකරණ නිවැරැදිව යෙදිය යුතුය.
- අක්ෂර වින්‍යාසයේදී සම්පූර්ණ පොත පුරා එකම පිළිවෙළක් අනුගමනය කර තිබිය යුතුය.

  උදාහරණ : කන්නාඩි/ කණ්ණාඩි

  ඉහත වචනයෙහි දෙයාකාරයම නිවැරැදිය. නමුත් එකම පොතෙහි යෙදීමේ දී එක් ක්‍රමයක් පමණක් යෙදිය යුතුය.

- පද බෙදීමේදී එක් ක්‍රමයක් අනුගමනය කළ යුතුය.

## 2.3 පින්තූර චිත්‍ර හා වර්ණ භාවිතය

ළමා කතාන්දර පොතක චිත්‍රවලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. කතාවේ පෙළ කොටසට හිමිවන සමාන වැදගත්කමක් පින්තූරවලටද හිමි වේ.

පින්තූර හා චිත්‍ර, කතාවේ අන්තර්ගතය නිසිලෙස ග්‍රහණය කර ගත හැකි ආකාරයට නිර්මාණය විය යුතුයි.

මුල් ළමා වියේ දරුවන්ගේ ළමා ග්‍රන්ථවල චිත්‍ර මගින් පමණක් කතාව ඉදිරිපත් කෙරේ.

වයස අවුරුදු 3-5 අතර දරුවන් සඳහා නිර්මාණය කෙරන පොත්වල පෙළ කොටස අඩුවෙන් දෘශ්‍ය රූප වැඩි වශයෙන් යොදා ගත යුතුය.


පරිසරයේ නිතර ඇස ගැටෙන සජීවි හා අජීවි දේ / නිතර ඇස නොගැටෙන තාත්වික දේ / මායා කතා ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන මනඃකල්පිත දේ යන මේ සියල්ල ළමයා ග්‍රහණය කර ගනු ලබන්නේ ඉදිරිපත් කර ඇති දෘශ්‍ය රූප තුළිනි. එබැවින් ළමා පොතක චිත්‍ර ඇතුළත් කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

- ළමා මනසට තේරුම් ගත හැකි අයුරින් චිත්‍ර සරල විය යුතු අතර, කතාව ඉදිරිපත් කෙරෙන වයස් කාණ්ඩයට ගැළපෙන පරිදි නිර්මාණය විය යුතුය.


උදාහරණ :



(1)



(2)



(3)

- ඉහත රූප තුනෙහි විවිධාකාරයෙන් නිර්මාණය වී ඇති  චිත්‍ර විවිධ වයස් කාණ්ඩවල දරුවන් සඳහා සුදුසුය.

(1) හා (2) රූප 2-7 වයස් කාණ්ඩ දරුවන් සඳහා සුදුසුය. ළමා මනස ඉතා පහසුවෙන් ආකර්ෂණය කර ගැනීමට සමත් වන අතර, ළමා මනසට ගැළපෙන අයුරින් නිර්මාණය කර ඇත. 3 වන රූපය වයස අවුරුදු 9 න් පහළ දරුවන් සඳහා වන ළමා කතාවකට නොගැළපේ.

- පින්තූර හා චිත්‍ර කතාවේ තේමාවට හා අන්තර්ගතයට අදාළ විය යුතුය.

  ළමා කෘතියක කතුවරයා හා චිත්‍ර ශිල්පියා එක් අයෙකු නොවන අවස්ථාවලදී තේමාවට අදාළ නොවන නොගැළපෙන චිත්‍ර ඉදිරිපත් වේ.  එබැවින් කතා තේමාව, අන්තර්ගතය චිත්‍ර තුළින් නිරූපණය වී ඇත්දැයි තහවුරු කර ගැනීම කතුවරයාගේ වගකීම වේ. මෙහිදී කතුවරයා හා චිත්‍ර ශිල්පියා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව තිබීම වැදගත්වේ. එසේම චිත්‍ර ශිල්පියා කතාවට අදාළ චිත්‍ර නිර්මාණය කළ යුත්තේ කතාව සම්පූර්ණයෙන් කියවා අදහස ග්‍රහණය කර ගැනීමෙන් අනතුරුවය.

- ළමා කෘතියක ඉදිරිපත් කෙරෙන චිත්‍ර ඉතා නිවැරැදි විය යුතුයි.

උදාහරණ :  1

පුහුල් හොරා කරෙන් දූනේ (1 රූපය)



(2 රූපය)



ඉහත 1 රූපයෙහි පුහුල් ගෙඩියේ ස්වරූපය ලබු ගෙඩියක් ආකාරයෙන් ඇඳ තිබුණේ නම් එමගින් ද, 2 රූපයෙහි ආතා පැලඳ සිටින්නේ පටියකි. ඒ වෙනුවට ''ආතා හවඩියක් පැලඳ සිටිනවා යයි පැවසුයේ නම් එමගින්ද, දරුවාට වැරැදි පණිවුඩයක් ලැබේ.

- ළමා පොතක චිත්‍ර විස්තරාත්මක වීම තුළින් දරුවාට පුළුල් ලෝකයක් විවෘත වන අතර එය ඉතා සාර්ථක වේ


  පහත රූපය පැරැණි ගමක් නොදුටු දරුවකුට පවා ගම්බද පරිසරයක් පිළිබඳව කොතරම් පැහැදිලි චිත්‍රයක් ලැබෙන්නේද යන්නට කදිම නිදසුනකි.



- අදාළ පිටුවල විස්තරවලට ගැළපෙන හා සුදුසු ස්ථානවල චිත්‍ර ඇතුළත් කළ යුතුය.

- කතාවට අදාළ අයුරින් චිත්‍ර හෝ පින්තූර භාවිත කිරීමේදී ඒවා කොටු ස්වරූපයෙන් නොයෙදිය යුතුය. අදාළ රූපය පිටුව පුරා විසිරී යන ආකාරයට යෙදීම සුදුසුය. මෙමගින් දරුවාගේ සිතුවිලි එක් රාමුවකට කොටුවීම වැළැක්වීම අපේක්ෂා කෙරේ.

උදාහරණ :








- නිර්මාණයේදී චිත්‍රවල සාර්ථකත්වය සඳහා කතාවට උචිත පරිදි චිත්‍ර තුළින් හැඟීම් ප්‍රකාශ වී තිබීම ඉතා වැදගත්ය. එවැනි චිත්‍ර ළමා මනස ස්පර්ශ කිරීමට සමත්ය.

උදාහරණ :





- ආධුනික මට්ටමේ චිත්‍ර යෙදීමෙන් පොත කෙරෙහි ඇති ආකර්ෂණය අඩු කරන අතර ළමයා කියවීමට ඇති පෙලඹවීමද දුරස් කරයි.

උදාහරණ : (1 රූපය)





(2 රූපය)




ඉහත දැක්වෙන්නේ එකම කතාවක් සඳහා චිත්‍ර ශිල්පීන් දෙදෙනකු නිර්මාණය කර ඇති සිතුවම්ය. මෙයින් දෙවන රූපයේ චිත්‍ර ආධුනික මට්ටමක පවතී.

- චිත්‍ර මගින් ඉදිරිපත් කෙරෙන හැඩතල පිළිබඳ සැලකිලිමත් වීමද ළමා චිත්‍ර නිර්මාණයේ දී වැදගත් වේ. ඇතැම් හැඩතල ළමා මනසේ මෘදු බවට, මටසිලිටි බවට හා සෞම්‍ය බවට නුසුදුසු වේ.

උදාහරණ : (1 රූපය)



(2 රූපය)




ඉහත 1 රූපයේ ත්‍රිකෝණ හැඩැති සාරි මෝස්තරයට වඩා 2 වන රූපයේ සාරි මෝස්තරය ළමයාගේ මනසට සෞම්‍ය බවක් ඇති කරයි. කටු, උල් වැනි හැඩතල ළමා මනසට යෝග්‍ය නොවේ.

## වර්ණ භාවිතය

- ළමා මනසට වඩාත් ආකර්ෂණීය බැවින් වර්ණ චිත්‍ර ඇතුළත් වීම වඩා සුදුසුය.



- අඳුරු පැහැති වර්ණ ප්‍රමුඛව භාවිත කිරීම සුදුසු නැත.
- පිටුවේ පසුබිම වර්ණය වෛවර්ණ ආකාරයට සැකසීම නුදුසුසුය. එය ඇසට පීඩාකාරී වන අතර, කතාවේ ගලා යාමට හා රසවින්දනයට හානිකර වන්නකි.
- සුදු පසුබිමක මුද්‍රණය හෝ කතාවේ තේමාවට ගැළපෙන පරිදි එක් වර්ණයක් භාවිත කිරීම වඩා සුදුසුය. පහත රූපය ඒ සඳහා ගැළපෙන උදාහරණයකි.




- පොතෙහි වම්පස හා දකුණු පස පිටු වර්ණ දෙකක් යටතේ මුද්‍රණය සුදුසු නැත. එය කියවීමෙහි ඒකාග්‍රතාව බිඳී යාමට හේතුවේ.
- පිටුව කළු පැහැති පසුබිමක් ලෙස සකස් කර සුදු වර්ණයෙන් අකුරු මුද්‍රණය සුදුසු නොවේ.

# ළමා ග්‍රන්ථයක භෞතික නිමාව

## ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු

### 3. මුල් පිටු

#### 3.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව

පිටකවරයෙන් පසුව යෙදෙන පළමු පිටුව අර්ධ ග්‍රන්ථනාම පිටුව වේ. මෙහි ග්‍රන්ථනාමය පමණක් සඳහන් කළ යුතුය.

උදාහරණ :

> සුදු පුංචා හරිහපනා

උප ග්‍රන්ථනාමයක් හෝ සමාන්තර ග්‍රන්ථනාමයක් ඇත්නම් එය ග්‍රන්ථනාමයෙන් වෙන්ව හඳුනාගත හැකි වන සේ මුද්‍රණය කළ යුතු වේ.

උදාහරණ :

> සුදු පුංචා හරිහපනා
>
> ළමා ගීත එකතුවක්

ළමා කෘතියක සීමිත පිටු සංඛ්‍යාවක් පවතින බැවින්, බොහෝ අවස්ථාවල අර්ධ ග්‍රන්ථනාම පිටුව නොමැතිව ග්‍රන්ථනාම පිටුව පමණක් යෙදිය හැක.

කර්තෘගේ වෙනත් කෘති සඳහන් කළ යුතු අවස්ථාවල අර්ධ ග්‍රන්ථනාම පිටුව යෙදීම අවශ්‍ය වේ.

## 3.2 අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව

තත් කෘතියේ කර්තෘ, පරිවර්තක, සංස්කාරක හෝ සම්පාදක විසින් ලියා පළ කරන ලද වෙනත් කෘති, කර්තෘගේ, පරිවර්තකගේ හෝ සංස්කාරකගේ හෝ සම්පාදනකගේ වෙනත් කෘති සහ ශීර්ෂය යටතේ ප්‍රකාශිත වර්ෂයන් කාලක්‍රමාණුගතව (Chronologically) මෙම පිටුවෙහි සඳහන් කළ යුතුය. කර්තෘ පිටුව හා දැන්වීම් පිටුව ලෙස ද මෙම පිටුව හැඳින්වේ.

උදාහරණ :

කර්තෘගේ වෙනත් කෘති

| | |
|---|---|
| මගේ ගෙදර | 2009 |
| පුංචි සුරතලා | 2011 |
| මී මොරේ සවාරියක් | 2014 |

කර්තෘ විසින් විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ ග්‍රන්ථ රචනා කර ඇතත්, ළමා ග්‍රන්ථවල විස්තර පමණක් ඇතුළත් කිරීම සුදුසු ය.

## 3.3 ග්‍රන්ථනාම පිටුව :

### 3.3.1 ග්‍රන්ථනාමය

ප්‍රධාන ග්‍රන්ථනාමය පොතේ ප්‍රමාණයට ගැලපෙන සේ කැපී පෙනෙන අයුරින් පිටුවෙහි මදක් ඉහළින් මුද්‍රණය කළ යුතුය. උප ග්‍රන්ථනාමයක් ඇත්නම් එය ග්‍රන්ථනාමයට සාපේක්ෂකව කුඩා ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කළ යුතුය.

උදාහරණ :

මගේ පැතුම
ළමා පද්‍ය සංග්‍රහය

ග්‍රන්ථ නාමය සිරස්ව යෙදීම නොකළමනාය.

උදාහරණ :

ගජ මිතුරු කතාව ✓

ග
ජ
මි
තු
රු ✗

ක
තා
ව

### 3.3.2 කර්තෘ

- කර්තෘ නාමය සඳහන් කරන්න
- කර්තෘවරුන් කිහිප දෙනෙකුගේ දායකත්වය ලැබී ඇත්නම්, කෘතියෙහි අන්තර්ගතයට දක්වන ලද දායකත්වය අනුව ඔවුන්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.
- පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නම් මුල් කර්තෘගේ නම මුලින් සඳහන් කොට පරිවර්තකගේ / අනුවර්තකගේ නම 'පරිවර්තනය' හෝ 'අනුවර්තනය' යන ශීර්ෂ යටතේ සඳහන් කරන්න.

### 3.3.3 ප්‍රකාශක


- ප්‍රකාශක නාමය සහ ප්‍රකාශන ස්ථානය පිළිවෙළින් සඳහන් කරන්න. එසේම ප්‍රකාශන ලාංඡනය ප්‍රකාශක නාමයට ඉහළින් යෙදිය හැක. (කෘතියක ප්‍රකාශකයා යනු මුද්‍රණය සඳහා මුදල් වියදම් කරන තැනැත්තා වේ)

උදාහරණ :

ලෝටස් සහ සහෝදරයෝ
ප්‍රකාශනයකි

- කර්තෘ විසින්ම ප්‍රකාශනය කරනු ලබයි නම් 'කර්තෘ ප්‍රකාශනයකි'. යනුවෙන් සඳහන් කරන්න.
- ග්‍රන්ථ නාමය, කර්තෘගේ නම හෝ සම්පාදකගේ නම හා ප්‍රකාශකගේ නම අනිවාර්යෙන් ම මෙම පිටුවේ යෙදිය යුතුය.


උදාහරණ :




### 3.3.4 පුස්තකාල බලපත්‍රය

පුස්තකාල සඳහා සුදුසු පොතක් වෙනුවෙන් ලබා දෙන නිර්දේශය ලබා ගත් පොතක් නම් ග්‍රන්ථ නාමයට ඉහළ දකුණුපසින් මුද්‍රණය කළ යුතුය. එසේම එහි විශ්කම්භය සෙ.මි. 3ක් විය යුතුය.

උදාහරණ :




## 3.4 ග්‍රන්ථ නාම පිටුවෙහි පසු පිටුව

### 3.4.1 අනුග්‍රහය පිළිබඳ ප්‍රකාශය

රජයේ හෝ වෙනත් ආයතනයක අනුග්‍රහය යටතේ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කෙරේ නම්, ඒ බව සඳහන් කරන්න. අනුග්‍රාහක ප්‍රකාශය පොයින්ට් 10 ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කිරීම සුදුසුය.

උදාහරණ :

> මෙම කෘතිය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයගෙන් මුද්‍රාපිතයි. මෙහි අන්තර්ගතය මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලකුව මනාය.

### 3.4.2 කර්තෘ හිමිකම් ප්‍රකාශය

ඉංග්‍රීසි හෝඩියේ "C" අක්ෂරය රවුමක් තුළ යොදා © ඊට ඉදිරියෙන් ප්‍රකාශන අයිතිය හිමි පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ප්‍රකාශිත වර්ෂය සඳහන් කරන්න.

උදාහරණ : © සිබිල් වෙත්තසිංහ

### 3.4.3 පුනර් මුද්‍රණය

ග්‍රන්ථයක පුනර් මුද්‍රණයක් නම් වර්තමාන මුද්‍රණ වර්ෂය කර්තෘ හිමිකම් ප්‍රකාශය සඳහා යෙදිය යුතු අතර, පූර්ව මුද්‍රණ වර්ෂ ඊට පහළින් ප්‍රථම මුද්‍රණය, දෙවන මුද්‍රණය වශයෙන් ශීර්ෂ යටතේ යෙදිය යුතුය.

උදාහරණ :

© සිබිල් වෙත්තසිංහ

ප්‍රථම මුද්‍රණය 2015
දෙවන මුද්‍රණය 2016

### 3.4.4 අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN)

පොතක් වෙන් වශයෙන් හඳුනාගැනීම සඳහා ලබා ගනු ලබන අන්තර්ජාතික අංක ක්‍රමයකි.

මෙම අංක ලබා ගැනීම සඳහා ලංකාවේ ඇති ජාතික ආයතනය වන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි.

ISBN අංකය ඇතුළත මුද්‍රණය කළ යුතු නිවැරදි ක්‍රමය

මෙම අංකය පොයින්ට් 12 ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කළ යුතු අතර, එම අංකය ග්‍රන්ථ නාම පිටුවෙහි පසු පිටුවේ මුද්‍රණය පිළිබඳ ප්‍රකාශනයක පහළින් හා පිටකවරයේ පිටු පස දකුණු පසින් පහළ සිට අඟල් 01ක් ඉහළින් Bar code අංකය හා සමගින් මුද්‍රණය කළ යුතුය.

උදාහරණ :

ISBN 978-955-677-698-0

ISBN 978-955-677-698-0
9 789556 776980

ස්වර ප්‍රස්ථාර සහිත මුද්‍රිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය (ISMN) ලබා ගත යුතුය.

ISMN 979-0-2600-0043-8

9 790260 000438

උදාහරණ :

ISMN 979-0-2600-0043-8

**3.4.5 පාසල් පුස්තකාල බලපත්‍රය**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මෙම බලපත්‍රය පාසල් පුස්තකාල සඳහා අනුමත ග්‍රන්ථයක් ලෙස නිර්දේශය ලබා දෙයි. මෙම බලපත්‍රය ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටෙහි ISBN අංකයට පසුව මුද්‍රණය කිරීම සුදුසුය.

**3.4.6 ග්‍රන්ථය සඳහා දායක වූවෝ**

ග්‍රන්ථයෙහි පිටකවරය සැලසුම්කරණය, පරිගණක අක්ෂර සංයෝජන, ඡායාරූප, මුද්‍රණය හා බෙදාහැරීම යන කාර්යයන් සඳහා දායක වූ පුද්ගලයන් හෝ ආයතන නාම සහ ලිපිනයන් අදාළ ශීර්ෂ යටතේ සඳහන් කළ හැකිය.

උදාහරණ :

| | | |
|---|---|---|
| පිටකවරය හා සිතුවම් | : | අනුර රාමනායක |
| පිටු සැලසුම | : | ඒ. උදය විමලදාස |

ග්‍රන්ථ මුද්‍රණය කිරීම සහ අක්ෂර සංයෝජනය කිරීම එකම ආයතනයක් විසින් සිදු කර ඇත්නම් එය නැවතත් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවලදී මුද්‍රණකරු පිළිබඳව පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය.

උදාහරණ :


මුද්‍රණය : ගොඩකුඹුර මුද්‍රණාලය<br>අංක 125, ගොඩගම, මීගොඩ.

3.4.7 **ප්‍රකාශක**

ග්‍රන්ථය ප්‍රකාශනයට පත්කර ඇත්තේ යම් ආයතනයක් මගින් නම්, එහි නම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර, ග්‍රන්ථය කර්තෘ විසින් ප්‍රකාශයට පත් කරන අවස්ථාව “ කර්තෘ ප්‍රකාශනයක් " යනුවෙන් සඳහන් කළ යුතුය.

3.4.8 **බෙදාහැරීම**

ග්‍රන්ථය බෙදාහැරීම ප්‍රකාශක විසින් නොව වෙනත් ආයතනයක් මගින් සිදු කරයි නම් එම ආයතනයේ නම හා ලිපිනය “ බෙදාහැරීම " යන ශීර්ෂ යටතේ සඳහන් කළ හැකිය.


මෙම කෘතිය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් මුද්‍රාපිතයි.
මෙහි අන්තර්ගතය මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලකුව මනාය

සෙව්වන්දිට හරි පුදුමයි
© ගීතා මුණසිංහ
ප්‍රථම මුද්‍රණය -2016
ISBN 978-955-31-0748-0

උදාහරණ :

බෙදාහැරීම : සුමධුර ප්‍රකාශන
නො. 225, වෙරළ පාර, වැල්ලවත්ත.
0112653867

## 4. පිටකවර සකස් කිරීම


- පිටකවරය සකස් කිරීමේ දී කතාවේ සමස්තය නියෝජනය කිරීම සිදු විය යුතුය.
- ළමා ග්‍රන්ථයක පිටකවරය සඳහා 230 gsm Artboard හෝ බෝඩ් කවරය යොදා ගත හැකිය.
- පිටකවරයේ ඉදිරිපස පිටුවෙහි ග්‍රන්ථ නාමය සමඟ කර්තෘගේ සම්පාදකගේ හෝ සංස්කාරකගේ නම සඳහන් කළ යුතුය. ග්‍රන්ථය පරිවර්තනයක් නම් එහි මුල් කර්තෘ මෙන්ම පරිවර්තිත ග්‍රන්ථ නාමය සඳහන් කළ යුතුය. පරිවර්තකගේ නම සඳහන් නොකිරීම පිළිගත් සම්ප්‍රදාය වන අතර එය ග්‍රන්ථ නාම පිටුවෙහි සඳහන් කළ යුතුය.

- පසු පස පිටකවරයේදී පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ යුතුය.

  ★ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය හා බාර්කෝඩ් සටහන
  ★ පසුවදන - (අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීම)
  ★ ග්‍රන්ථයෙහි මිල
  ★ ප්‍රකාශකගේ නම සහ ලිපිනය
  ★ ළමා ග්‍රන්ථයක කර්තෘගේ ඡායාරූප ඇතුළත් කිරීම සුදුසු නොවේ.

- පසුපස පිටකවරයෙහි ඇතුළත පිටුව හිස් පිටුවක් විය යුතුය.
- ළමා ග්‍රන්ථයක පිටකවරය සකස් කිරීමේදී එහි වර්ණ භාවිතය හා නිමාව මෙන්ම ආකර්ෂණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

උදාහරණ :







- පොත නිර්දේශ කරනු ලබන වයස් කාණ්ඩය පිළිබඳවද පිටකවරයෙහි සඳහන් කිරීම නිවැරදි ක්‍රමය වේ. මෙම වයස් කාණ්ඩය සඳහන් කිරීමේදී 2.1 කොටසෙහි දක්වා ඇති වයස් කාණ්ඩ අනුගමනය කිරීම වඩාත් නිවැරදි වේ.

උදාහරණ :




## 5. පිටු අංකනය කිරීම

5.1 ග්‍රන්ථයෙහි මුල් පිටු සඳහා පෙරවදන, හැඳින්වීම ඇතුළත් කරන්නේ නම් රෝම ඉලක්කම් යෙදිය යුතුය.

5.2 කතන්දරය ආරම්භ වන පිටුවේ සිට පිටු අංකනය කිරීම (පිටු අංක 1) සිදු කළ යුතුය - ආරම්භක පිටුව අංකනය කිරීම අවශ්‍ය නොවන අතර, දෙවන පිටුවේ සිට අංකනය ආරම්භ කරන්න.

5.3 පිටු අංකය පිටුවෙහි මුද්‍රණය කරන ස්ථානය විවිධය. එනම් පිටුවෙහි ඉහළ හෝ පහළ පිටුවේ මැද යන ස්ථානවලය. නමුත් මෙම ක්‍රම මිශ්‍රව භාවිත කළ නොහැකි අතර, එක් නිශ්චිත ක්‍රමයක් පමණක් අනුගමනය කළ යුතුය.

උදාහරණ :




## 6. අකුරු ප්‍රමාණය හැඩය හා යෙදවීම

- ළමා ග්‍රන්ථවල අකුරු භාවිත කිරීමේදී රවුම් අකුරු භාවිත කිරීම වඩා සුදුසුය. පොයින්ට් 16 ප්‍රමාණයේ අකුරු යොදා ගත හැකිය. එසේම පොයින්ට් ප්‍රමාණය වයස සමග වෙනස් විය යුතුය.
- එසේ බොහෝ අවස්ථාවල අකුරු භාවිත කරීමේදී විවිධ වර්ණයෙන් හා හැඩයෙන් යුත් අකුරු සුදුසු තැන්වල භාවිත කිරීම සුදුසුය.
- බුද්ධි වර්ධන අවධියේදී (උපතේ සිට අවුරුදු 2) හා ප්‍රතිභාචින්තන අවධියේදී (අවුරුදු 2-5) අකුරු 30/28/22 පොයින්ට් ප්‍රමාණයෙන් යෙදිය යුතුය.
- සම්මත පැහැදිලි රවුම් අකුරු භාවිත කිරීම සුදුසුය.

උදාහරණ - ගජ මිතුරා

# 7. ග්‍රන්ථයේ සමස්ත නිමාව

## 7.1 ග්‍රන්ථයෙහි ප්‍රමාණය හා කඩදාසි වර්ග

ළමා ග්‍රන්ථකරණයේදී අනෙකුත් ශාස්ත්‍රීය කෘති ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිලිමත් වන කරුණුවලට වඩා විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මන්දයත් දරුවන්ගේ වයස් ප්‍රමාණය අනුව එය වෙනස් විය යුතු බැවිනි. ළමා ග්‍රන්ථ සඳහා වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් කඩදාසි වේ.

A4 210mmx297mm

B5 176mmx250mm

ළමා ග්‍රන්ථ සඳහා මෙම ප්‍රමාණයෙන් වඩා ප්‍රචලිත වූවත් B5 ප්‍රමාණයේ කඩදාසි ප්‍රමාණයෙන් නිමාවනු ග්‍රන්ථ ළමයින් සඳහා වඩා යෝග්‍ය වේ. එය ළමයාට පාසැල් බෑගය තුළ බහාලීමටද පහසු වේ.

මෙහිදී

A5 ප්‍රමාණයද ළමා ග්‍රන්ථ සඳහා යෝග්‍ය වන අතර,

- 148mm x 210mm
- 148mm x 220mm යන ප්‍රමාණ දෙකම දෙකම භාවිත කළ හැක.

පහත සඳහන් කඩදාසි වර්ග ළමා ග්‍රන්ථ මුද්‍රණයේදී භාවිත කිරීම සඳහා සුදුසුය.

80 gsm
100/120 gsm Art paper

ළමා ග්‍රන්ථ සඳහා භාවිත කරන කඩදාසි බරින් අඩු අපරදෘශ්‍ය/ විනිවිද නොපෙනෙන (Opaque) කඩදාසි වර්ගය විය යුතුය. මුල් ළමා විය සංවර්ධන මට්ටමේ පසුවන දරුවන් වෙනුවෙන් ළමා පොත් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ඔවුන් තුළ පොත පත පිළිබඳව රුචිකත්වය ඇති කරවීමේ අරමුණිනි. මේ නිසා සෑම විටම 100/120 gsm Art paper හෝ මැට් ලැමිනේටින් කළ ඝන කඩදාසි යොදා ගැනීම සුදුසුය.


● UNESCO අන්තර්ජාතික ප්‍රමිතියට අනුව ළමා ග්‍රන්ථයක අවම පිටු ප්‍රමාණය පිටු 16කි.


## 7.2 ග්‍රන්ථයක හැඩය

කුඩා දරුවන් වෙනුවෙන් ග්‍රන්ථ නිර්මාණය කිරීමේදී දරුවන්ගේ ආකර්ෂණය හා වැඩි අවධානයක් ලබා ගැනීම වෙනුවෙන් වයස් කාණ්ඩය අනුව පොතේ ආකෘතියට විවිධ හැඩතල යොදා ගත හැකිය.

උදාහරණ :







## 7.3 පිටුවේ සැකැස්ම

සම්මත කඩදාසි ප්‍රමාණයට හා ඒ අනුව සැකසුණු පොතේ ප්‍රමාණයට ගැලපෙන සේ පෙළ සහිත කොටස (Text Area) භාවිත කළ යුතුය. ළමා ග්‍රන්ථයක දී බොහෝ විට චිත්‍ර භාවිත කිරීම තුළ කථාංගය දරුවාට වඩා හොඳින් සම්ප්‍රේෂණය වන බැවින්, පෙළ කොටස (වචන) ඉතා සීමිතව යොදා ගත යුතුය. (මෙය වයස් කාණ්ඩය අනුව වෙනස් විය යුතුය.)

උදාහරණ:




- පේළි අතර සමාන ඉඩ ප්‍රමාණයක් තැබිය යුතුය. 1.5